# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2306/22 - 2022 නොවැම්බර් මස 15 වැනි අඟහරුවාදා - 2022.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල වන මම, එකී මණ්ඩලයට, ගිරිඋල්ල - දඹදෙණිය - නාරම්මල ජල සම්පාදන ව්‍යාපෘතියේ හමන්ගල්ල ඝන මීටර් 1500 ක ජල කුළුණ ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල**,<br>
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/KG/519<br>
2022 නොවැම්බර් මස 02 වැනි දින,<br>
ජල සම්පාදන අමාත්‍යාංශය,<br>
"ලක්දිය මැදුර",<br>
35, නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1570, මැද්දෙපොල පහළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැද්දෙපොළ ගමේ පිහිටි, "කොරසගොල්ල මූකලාන" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 30 ක් පමණ වන ඉඩම් කොටස :

1A - G 38057 — 17 (2022/11)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| | | |
|---|---|---|
| කැබලි අංක | : | A |
| ඉඩමේ නම | : | කොරසගොල්ල මූකලාන |
| ප්‍රමාණය | : | පරචස් 15 |

මායිම්

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| නැගෙනහිරට | : | මාර්ගය |
| දකුණට | : | අයි. එම්. ප්‍රේමතිලක හිමිකම් කියන ඉඩම |
| බටහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |

| | | |
|---|---|---|
| කැබලි අංක | : | B |
| ඉඩමේ නම | : | කොරසගොල්ල මූකලාන |
| ප්‍රමාණය | : | පරචස් 15 |

මායිම්

| | | |
|---|---|---|
| උතුරට | : | කේ. එම්. කරුණාවතී හිමිකම් කියන ඉඩම |
| නැගෙනහිරට | : | මාර්ගය |
| දකුණට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| බටහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :

1. කැබලි අංක A,
   කේ. එම්. කරුණාවතී මහත්මිය,
   මැද්දෙගෙල,
   හේනෙයාය,
   ගිරිඋල්ල.

2. කැබලි අංක B,
   අයි. එම්. ප්‍රේමතිලක මහත්මිය,
   මැද්දෙගෙල,
   හේනෙයාය,
   ගිරිඋල්ල.

EOG 11 - 0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.